## 21. අත්ථි ප්‍රත්‍යයේ ත්‍රිරාශිය

සහජාත අත්ථි ප්‍රත්‍යය, පුරේජාත අත්ථි ප්‍රත්‍යය, පච්ඡාජාත අත්ථි ප්‍රත්‍යය, ආහාර අත්ථි ප්‍රත්‍යය, ඉන්ද්‍රිය අත්ථි ප්‍රත්‍යය යැයි අත්ථි ප්‍රත්‍යය පස්වැදෑරුම් වේ. ඒවා අතරින් සහජාත අත්ථි ප්‍රත්‍යය සහජාත ප්‍රත්‍යය හා සමාන ය. පුරේජාත අත්ථි ප්‍රත්‍යය පුරේජාත දෙවර්ගය හා සමාන ය. පච්ඡාජාත අත්ථි ප්‍රත්‍යය පච්ඡාජාතා ප්‍රත්‍යය හා සමාන ය. ආහාර අත්ථි ප්‍රත්‍යය රූපාහාර ප්‍රත්‍යය හා සමාන ය. ඉන්‍ද්‍රිය අත්ථි ප්‍රත්‍යය රූපජීවිතින්‍ද්‍රිය හා සමාන ය.

## 22.-24. නත්ථි, විගත, අවිගත ප්‍රත්‍යයේ ත්‍රිරාශිය

නත්ථි ප්‍රත්‍යය හා විගත ප්‍රත්‍යය, අනන්තර ප්‍රත්‍යය හා සමාන ය. අවිගත ප්‍රත්‍යය අත්ථි හා සමාන ය.

---

විද්‍යාමාන වෙමින් උපකාරක වන්නා වූ ශක්තිය අත්ථි ප්‍රත්‍යය නම් වේ. මෙම අත්ථි ප්‍රත්‍යයෙහි ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න දෙක ම " අත්ථි - ඇත" යන වචනයට අනුකූලව වර්තමාන අවස්ථාවේ දී විද්‍යමාන වේ. "උත්පාදයේ දී හෝ වේවා ස්ථිති ක්‍ෂණයේ දී හෝ වේවා භඞ්ග ක්‍ෂණයේ දී හෝ වේවා ප්‍රකට වීම ප්‍රත්‍යුත්පන්න කාලයේ දී (වර්තමානයේ දී) ප්‍රකට වීම" යැයි අදහස් කෙරේ. එබැවින් පූර්වාචාර්යයන් වහන්සේලා "අත්ථි ප්‍රත්‍යය වෘක්‍ෂයන්ට උපකාර කරන්නා වූ පෘථුවියට" උපමා කළ සේක. "පෘථුවිය විසින් තමා විද්‍යමාන වන්නා වූ අවස්ථාවේ දී තමා මතුපිට ඇති බීජ හේතුවෙන් හටගන්නා වූ (විද්‍යමාන වන) වෘක්‍ෂයන්ට හරිතවත් වීමට උපකාර කරන්නාක් මෙන්, මෙම අත්ථි ප්‍රත්‍යය විද්‍යමාන වන අවස්ථාවේ දී තමා මෙන් විද්‍යමාන වන ධර්මයන්ට ද උපකාර වේ" යනු එහි අදහස යි.

අටුවා - පච්චුප්පන්නලක්ඛණෙන අත්ථිභාවෙන තාදිසස්සෙව ධම්මස්ස උපත්ථම්භකට්ඨෙන උපකාරකො ධම්මො අත්ථිපච්චයො.

විස්තර කරන්නෙමි - මෙම අත්ථි ප්‍රත්‍යය ජනක, උපස්ථම්භක ප්‍රත්‍යය වර්ග දෙකින් ම සුදුසු පරිදි උපකාරක වේ. එසේ වුව ද " අත්ථි - අත්ථි, ඇත" යන වචනය ගැඹුරින් සිතා බැලීමේ දී උත්පාදයෙන් අනතුරුව ස්ථිති ක්‍ෂණයට පැමිණි පසු අත්ථි ශක්තිය ඇති බව හොඳින් ප්‍රකට වේ. "උත්පාද සහ භඞ්ග අවස්ථාවන්හි දී විද්‍යමාන වේ ය යනුවෙන් පැවසුව ද ඉපදීම සහ බිඳීම නිසා එහි අස්තිත්වය ප්‍රකට නො වේ. ස්ථිති ක්‍ෂණයේ දී ම ප්‍රකට වේ" යැයි අදහස් වේ. මෙසේ මෙම අත්ථි ප්‍රත්‍යයේ ජනක ශක්තියට වඩා උපස්ථම්භක ශක්තිය ප්‍රධාන වන බැවින් අටුවාවෙහි " උපත්ථම්භකට්ඨෙන" යැයි ද මූලටීකාවේ දී "සතිපි ජනකත්තෙ

උපත්ථම්භකප්පධානා" යැයි ද අනුටීකාවේ දී "යදිපි උප්පාදතො පට්ඨාය යාව භඞ්ගා ලබ්භමානතා අත්ථිභාවො තථාපි තස්ස යථා උප්පාදක්ඛණතො ඨිතික්ඛණෙ සාතිසයො ඛ්‍යාපාරො එවං පච්චුප්පන්නෙපි" යැයි දක්වූහ.

**සහජාතත්ථි** - සහජාත ප්‍රත්‍යයේ දී දක්වූ ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ වර්තමාන ස්වභාව වශයෙන් විද්‍යමාන වීම හේතුවෙන් අත්ථි ස්වභාවයට ද පැමිණේ. එබැවින් "සහජාත අත්ථි ප්‍රත්‍යය සහජාත ප්‍රත්‍යය හා සමාන ය" යැයි දක්වීය.

**පුරෙජාතත්ථි** - "පුරේජාත අත්ථි ප්‍රත්‍යය පුරේජාත දෙවර්ගය හා සමාන ය" යන තැන වත්ථුපුරේජාත හා ආරම්මණ පුරේජාත යැයි දෙවැදෑරුම් වන පුරේජාත සමඟ සමාන වේ. එය නිවැරදිය - වත්ථුපුරේජාතයේ දී දක්වූ වස්තු රූපයෝ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් පහළ වන අවස්ථාවේ දී තමා ද අත්ථි භාවයෙන් විද්‍යමාන වෙති. ආරම්මණ පුරේජාත ධර්මයන් ද අත්ථි භාවයෙන් විද්‍යමාන වන්නා වූ ප්‍රත්‍යයෝත්පන්න අරමුණකි.

**ආහාරත්ථි සහ ඉන්ද්‍රිය අත්ථි** - පච්ඡාජාත අත්ථියේ ස්වභාවය පච්ඡාජාත ප්‍රත්‍යය විස්තර කරන තැන දී දක්වන ලදී. නාමාහාර සහ සහජාතින්ද්‍රියයෝ සහජාත අත්ථිවල ඇතුළත් වීය. පුරේජාතින්ද්‍රිය ද පුරේජාත අත්ථිවල ඇතුළත් වීය. එබැවින් "ආහාර අත්ථි ප්‍රත්‍යය රූපාහාර ප්‍රත්‍යය හා සමාන ය. ඉන්ද්‍රිය අත්ථි ප්‍රත්‍යය රූපජීවිතින්ද්‍රිය හා සමාන ය" යැයි දක්වීය.

**නිර්වාණය අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය නො වේ** - "නිර්වාණය පර්මාර්ථ වශයෙන් විද්‍යමාන වීම නිසා අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය විය යුතු නො වේ ද" යැයි චෝදනාවකි. පරිහාරය නම් - "අත්ථි- ඇත" යන වචනය පිළිබඳ කල්පනා කළහොත් "ඇති විට ප්‍රත්‍යයක් යැයි ගත යුතු වන අතර නැති විට ප්‍රත්‍යයක් ගත යුතු නො වේ" යන අදහසට පැමිණේ. නිර්වාණය සඳහා එම දෙක ම නො ලැබේ. සැමවිට ම විද්‍යමාන වන බැවින් අත්ථි ප්‍රත්‍යයට නුසුදුසු ය. වෙනත් ක්‍රමයකින් කිවහොත් එක් ප්‍රත්‍යය ශක්තියක් පිළිබඳව ඊට ප්‍රතිවිරුද්ධ ප්‍රත්‍යය පදනම් කරමින් සිතා බැලීමේ දී වඩාත් හොඳින් ප්‍රකට වේ. අත්ථි ප්‍රත්‍යයේ ශක්තිය නත්ථි ප්‍රත්‍යයේ ශක්තියට ප්‍රතිවිරුද්ධ ය. නත්ථි ස්වභාවය යනු උත්පාද, ස්ථිති, භඞ්ග වශයෙන් විද්‍යමාන වීමෙන් අනතුරුව භඞ්ගයට පත්වී නොමැති භාවය යි. නිර්වාණයේ එබඳු ශක්ති ස්වභාවයක් නොමැති වීම නිසා නත්ථි ශක්තියේ ප්‍රතිවිරුද්ධ ශක්තිය වන අත්ථි ශක්තිය ද නැත. (මේ ක්‍රමයෙන් විගත ප්‍රත්‍යයට ප්‍රතිවිරුද්ධ වන්නා වූ අවිගත ශක්තිය නොමැති හේතුව ද දැනගන්න.)

**අවිගතපච්චයො -** (අත්ථි ප්‍රත්‍යයට අනතුරුව එය සමඟ ස්වරූපාර්ථ සමාන වන්නා වූ අවිගත ප්‍රත්‍යය විස්තර කිරීම වඩාත් පැහැදිලි ය.) අත්ථි ශබ්දය "විද්‍යමාන වන" යන අර්ථය ප්‍රකාශ කරයි. අවිගත ශබ්දය "තවමත් පහව නොගිය = තවමත් නිරුද්ධ නොවූ" යන අර්ථය ප්‍රකාශ කරයි. මෙම අවිගත ප්‍රත්‍යය මහාසමුද්‍රය මෙන් වේ යැයි පූර්වාචාර්යයන් වහන්සේලා උපමා කළහ. මහාසමුද්‍රය තමා කෙරෙහි පිහිට ඇත්තා වූ මත්ස්‍ය, කැසබු ආදීන්ට තමා පහව නොගොස් (නොවෙන්ව) නිදහසේ පිහිටා සිටීමට උපකාර කරන්නාක් මෙන්, මෙම අවිගත ප්‍රත්‍යය ද තමා පහව නොගොස් (නොවෙන්ව) තවමත් නිරුද්ධ වූ භාවයෙන් උපකාරක වේ ය යැයි අදහස් කෙරේ. එබැවින් පරමාර්ථ වශයෙන් විද්‍යමාන වීම් වශයෙන් උපකාරක ශක්තිය අත්ථි ප්‍රත්‍යය නම් වේ. පරමාර්ථ ස්වභාවයෙන් නොවෙන්ව තවමත් නිරුද්ධයට නොයෑම් වශයෙන් උපකාරක ශක්තිය අවිගත ශක්තිය නම් වේ. ගැඹුරින් සිතා බලද්දී අවිගත ශක්තිය නිරුද්ධයට ආසන්නව ඇති, භඞ්ගයෙන් අනතුරුව කෙළවරට පත්වීමට පෙර අවස්ථාවේ දී ඉතා ශක්තිමත් වේ ය යැයි ප්‍රකට වේ. උත්පාද, ස්ථිති අවස්ථාවේ දී අවිගත ශක්තිය නැත යැයි නොකිය යුතු.

මූලටීකා - අත්ථිතාය සසභාවතො උපකාරකතා අත්ථිපච්චයතා, සභාවවිගමෙන නිරොධස්ස අප්පත්තියා උපකාරකතා අවිගතපච්චයතාති පච්චයභාවවිසෙසො ධම්මාවිසෙසෙපි වෙදිතබ්බො.

අත්ථිභාවාය (ස සභාවතාය) - පරමාර්ථ ධර්මයන්ගේ විද්‍යමාන භාවයෙන්, උපකාරකතා - උපකාරක භාවය, අත්ථිපච්චයතා - අත්ථි ප්‍රත්‍ය භාවය (අත්ථි ශක්තිය) නම් වේ. සභවවිගමනෙන - ස්වභාවය පහව නොගිය භාවයෙන් (නොවෙන්ව), නිරොධස්ස අප්පත්තියා - නිරෝධයට නොපැමිණි භාවයෙන්, උපකාරකතා - උපකාරක භාවය, අවිගතපච්චයතා - අවිගත ප්‍රත්‍යය නම් වේ. ඉති - මෙසේ, ධම්මාවිසෙසෙපි - පරමාර්ථ ධර්මයන්ගේ විශේෂයක් (වෙනසක්) නොමැති වූයේ නමුදු, පච්චයභාවවිසෙසො - ප්‍රත්‍ය ශක්තියේ විශේෂය (වෙනස), වෙදිතබ්බො - දත යුතු වේ.

**නත්ථිපච්චයො, විගතපච්චයො -** නත්ථි ශබ්දය "නැත" යන අර්ථය ප්‍රකාශ කරයි. විගත ශබ්දය "පහව ගිය = නිරුද්ධ වූ" යන අර්ථය ප්‍රකාශ කරයි. එබැවින් නිවී ගිය පහන අන්ධකාරය ඇති කිරීම සඳහා අවකාශය ලබා දෙන්නාක් මෙන්, තමන්ගේ නොමැති භාවයෙන් පසුව උපදනා ධර්මයන් පහළ වීමට උපකාර කරන්නා වූ ශක්තිය නත්ථි ප්‍රත්‍යය නම් වේ. සූර්යාලෝකය ඉවත්ව ගොස්

චන්ද්‍රාලෝකය පහළ වීමට උපකාර වන්නාක් මෙන් ස්වකීය වෙන්ව යෑම පසු පසු ධර්මයන්ට අවකාශ ලබාදෙන්නා වූ උපකාරක ශක්තිය විගත ප්‍රත්‍යය නම් වේ. නත්ථියේ ස්වභාවය වනාහි නිරුද්ධයට අනතුරුව නොමැති වීම යි. විගතයේ ස්වභාවය නිරුද්ධයෙන් වෙන්ව යෑමයි. (නිරුද්ධයෙන් පසුව පැවතීම හෝ නොපැවතීම විගත ශක්තියේ කටයුත්තක් නොව නත්ථියේ කටයුත්තකි.)

අභාවමත්තෙන උපකාරකතා ඔකාසදානං නත්ථිපච්චයතා, සභාවාවිගමෙන අප්පවත්තමානානං සභාවවිගමෙන උපකාරකතා විගතපච්චයතා, නත්ථිතා ච නිරොධානන්තරසුඤ්ඤතා, විගතතා නිරොධප්පත්තතා, අයමෙතෙසං විසෙසො.

අභාවමත්තෙන - අභාව මාත්‍රයෙන්, උපකාරකතා - උපකාර භාවය, ඔකාසදානං - පසුව පහළ වන ධර්මයන්ට අවකාශ දීම, නත්ථිපච්චයතා - නත්ථි ප්‍රත්‍යය භාවය යි. අප්පවත්තමානානං - ඉපදීමට අවකාශ නොලබන පසුව පහළ වන ධර්මයන්ට, සභාවවිගමෙන - පරමාර්ථ ධර්මයන් වෙන්ව යෑමෙන්, උපකාරකතා - උපකාරක භාවය, විගතපච්චයතා - විගත ප්‍රත්‍යය භාවය යි.

ඇතැමෙක් "නත්ථි සහ විගත ද, අත්ථි සහ අවිගත ද දේශනා විලාස, පුද්ගලාධ්‍යාශ වශයෙන් සමාන ස්වරූපාර්ථ ඇතුළත් කරමින් දේශනා කරන ලදී" යැයි කියත්. එම ගුරුවරු මේ ප්‍රත්‍ය ධර්මයන්ගේ ශක්තීන් සමාන බැව් සලකා ඇත. සත්‍ය වශයෙන් නත්ථි ශක්තිය සහ විගත ශක්තිය ද අත්ථි ශක්තිය සහ අවිගත ශක්තිය ද වෙනස් වේ.

**ආරාධනාව** - පරමාර්ථ ධර්මයන්හි "ඵස්සයෙහි පැහැසීම, වේදනාවේ අරමුණු රස අනුභව කිරීම" ආදිය වචනයෙන් කීමක් නොව නිවැරදිව ඥානයෙන් දැනගැනීම දුෂ්කර වූවකි. එම ධර්මයන්ගේ ශක්තීන් වෙන් කොට ඒකාන්තයෙන් ම දැනගැනීමට අතිදුෂ්කර වූවකි. එසේ වුව ද ක්ලේශයන්ගෙන් විශේෂයෙන් මිදී සර්වාකාරයෙන් සුපිරිසිදු වූ චිත්ත ධාතුවේ නිධන් වූ සර්වඥතා ඥානයෙන් සියල්ලෙන් සියල්ල දකිමින් සූවිසි ප්‍රත්‍ය ශක්ති විශේෂය අප භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක යැයි ශ්‍රද්ධා ගෞරවය පෙරටු කොට ග්‍රන්ථයන් නැවත නැවතත් බැලිය යුතු. ප්‍රඥාවන්තයන්ගෙන් නැවත නැවතත් විමසිය යුතු. ගැඹුරු වන්නා වූ ශක්ති විශේෂයන් දැකිය හැකි තරමට නොකඩවා උත්සාහ කටයුතු.

මූලටීකා - ධම්මානඤ්හි සත්තිවිසෙසං සබ්බං යාථාවතො අභිසම්බුජ්ඣිත්වා තථාගතෙන චතුවීසතිපච්චයවිසෙසා වුත්තාති

භගවති සද්ධාය "එවංවිසෙසා එතෙ ධම්මා"ති සුතමයඤාණං උප්පාදෙත්වා චින්තාභාවනාමයෙහි තදභිසමයාය යොගො කාතබ්බො.